රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:14/90

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1990 මාර්තු මස 13 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථාවල සභාපතිවරුන්,
පළාත් පාලන අධිකාරිවල ප්‍රධානීන් සහ
අභ්‍යාස ආයතනවල ප්‍රධානීන් වෙත.

## කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකක පිහිටුවීම.

ඉහත සඳහන් කරුණ ගැන නිකුත් කළ අංක 6/89 හා 89.01.31 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පිළිබඳ වයි. "ජාතික රාජ්‍ය සේවා පුහුණු ප්‍රතිපත්තිය" පිළිබඳ අංක: 12/90 හා 1990 පෙබරවාරි මස 28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ද අවධානය යොමු කරවනු ලැබේ.

02. කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකක(කසපුඒ) සෑම අමාත්‍යාංශයක, පළාත් සභාවක සහ විශාල දෙපාර්තමේන්තුවකම පිහිටුවීම රජයේ අභිලාශයයි. කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයෙහි ප්‍රධානියා අදාල සංවිධානයෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විය යුතු අතර ඔහුට/ ඇයටම සතු රාජකාරිවලට අමතරව හෝ එසේ නැතහොත් වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුවේ අනුමැතියට යටත්ව එම අදාල කාර්යයන් අධික වේනම් තනතුරෙහි කා්රය සම්භාරය සැලකිල්ලට ගෙන මෙම කාර්යය ඔහු/ ඇය විසින් පූර්ණකාලීනව භාරගත යුතු වේ.

03. කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකයක් පිහිටුවීම ජාතික රාජ්‍ය සේවා පුහුණු ප්‍රතිපත්තියෙහි එක් අංගයකි. ආයතනයක කළමනාකරණ ගැටළු පිරික්සා දැන ඒවා පිළිබඳ විසඳුම් සොයා ගැනීම සඳහා එම ආයතනයටම විශිෂ්ඨ හැකියාවක් තිබේ. මේ අනුව තම ගැටළු හා ඒවාට විසඳුම් සම්බන්ධයෙන් ඒ ඒ ආයතනය විසින්ම වගකීම භාරගත යුතු වේ. සංවිධානයට අයත් ගැටළු විස්තර කොට ඒවාට විසඳුම් ඉදිරිපත් කිරීමට යත්න දැරීමේදී බාහිර ආයතනවල සහාය ලබා ගැනීමට සංවිධානය විසින් කටයුතු කරනු ඇත.

04 අදාල සංවිධානය සහ එහි කාර්ය මණ්ඩලය යන අංශ දෙකම ක.ස.පු.ඒකකයෙහි වගකීම් කාර්යයන්ට අයත්වේ. ක.ස.පු.ඒකකයට පැවරෙන විශේෂිත වගකීම් ඔබ විසින් නිශ්චය කෙරෙනු ඇත. එම ඒකකයට අයත් විය හැකි වගකීම් පිළිබඳ ලැයිස්තුවක් පහත දැක්වේ.

(අ )	සංවිධානය සම්බන්ධයෙන් එහි කාර්යයන් පහත සඳහන් කරුණුවලට අයත්වනු ඇත.

**(1)	<u>සංවිධාන විගණනය.</u>**

(අ)	වැඩසටහන්/ ව්‍යාපෘති පිළිබඳ රාමුව සකස් කිරීම

(ආ )	සංවිධානමය කාර්යක්ෂමතාවය හා ඵලදායීභාවය පිළිබඳ විගණන කටයුතු මෙහෙයවීම

(අං )	හිඟ වැඩ කටයුතු නිශ්චය කිරීම.

(ඇ)	ආයතනය, අංශය, ශාඛාව. ඒකකයට අදාල අරමුණු සහ වැඩ ප්‍රමිකයන් වැඩිදියුණු කිරීම.

(ඉ)ප්‍රතිඵල/ නිමැවුම්/ වැදගත් ඉලක්ක හඳුනා ගැනීම.

(ඊ)	රැකියා වර්ගීකරණයක් පිළියෙල කිරීම.

(උ)	සංවිධානය සඳහා මිනිස්බල සැලසුම් කිරීමේ කාර්ය භාර ගැනීම.

(ඌ)	ප්‍රමුඛත්වය දිය යුතු කරුණු සහ ක්‍රියාකාරී කාර්ය පරිපාටි පිළිබඳ වාර්තා සටහන් සකස් කිරීම.

(එ)නිලබල ක්‍රමය අහෝසි කිරීම සඳහා පියවර ගැනීම.

**(2)	<u>පරිපාලන ක්‍රම:-</u>**

(අ)1990 න් අරඹා එක් එක් වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමේ සැලසුම් පිලියෙල කිරීම.

(ආ )	පරිපාලන ක්‍රම ව්‍යුහ සහ කාර්ය පරිපාටි පුණරීක්ෂණය කිරීම සහ සංශෝධනය කිරීම.

(අං )	මූල්‍ය කළමනාකරණ ක්‍රමය දියුණු කිරීම.

(ඇ )	කාර්යාල ක්‍රම විධි හා පරිපාලන ව්‍යුහය පුණරීක්ෂණය හා සංශෝධනය කිරීම.

(ඉ)	කළමනාකරණ තොරතුරු ක්‍රම සහ කාර්යාල යාන්ත්‍රීකරණය සමාලෝචනය හා වැඩිදියුණු කිරීම.

(ඊ)	කාර්යාල සැලැස්මක් සැකසීම.

(උ) කාර්යයන් මෙහෙයුම් හා කාර්ය මන්ඩලය අධීක්ෂණය කෙරෙන බවට වගබලා ගැනීම.

(ආ ) කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් එහි කටයුතු ද පහත සඳහන් අයුරු වේ.

**(1) <u>පිරිස්:-</u>**

(අ) වැටුප් විෂමතා නිශ්චය කිරීම.

(ආ ) බඳවා ගැනීමේ තත්ත්වයන් හා ක්‍රියාපටිපාටීන් සංවර්ධනය.

(ඇ ) සේවක සම්බන්ධතා.

**(2) <u>පුහුණු හා වෘත්තීය සංවර්ධනය:</u>**

(අ) විවිධ සේවක වර්ගයන්හි පුහුණු අවශ්‍යතා නිශ්චය කිරීම.

(ආ ) අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා පුහුණු සැලසුම් පිළියෙල කිරීම.

(ඇ ) පුහුණු හා වෘත්තීය සංවර්ධන ප්‍රතිපත්ති සැලැස්ම ක්‍රියාත්මක කිරීම මෙහෙයවීම හා ඇගැයීම.

**(3) <u>ජාතික ආයතන සමඟ සම්බන්ධතාවය:</u>**

ක.ස.පු. ඒකකයක් පහත සඳහන් ආයතන සමඟ සම්බන්ධතා පැවැත්විය යුතුය.

(1) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (ශ්‍රී ලං.ප.ආ.)
(2) ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනය.
(3) කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.
(4) රාජ්‍ය සේවා පුහුණු ආයතනය.
(5) ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය.
(6) රාජ්‍ය පරිපාලන පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති අංශය.

ඔබගේ ආයතනයේ ක.ස.පු. ඒකකයක් පිහිටුවා ප්‍රධානියකු පත්කර ගැනීමට වහාම පියවර ගන්නා ලෙස උදක්ම ඉල්ලා සිටිනු ලැබේ. සියළුම ක.ස.පු. ඒකකයන්හි ප්‍රධානීන්ගේ රැස්වීමක් ඉදිරි කාලයේ දී කැඳවීමට බලාපොරොත්තු වෙමි. මෙම වැඩ සටහන සම්බන්ධයෙන් වැඩිමනක් කරුණු පිළිබඳව පහත සඳහන් අංශයෙන් කරුණාකර විමසන්න.

"කළමනාකරණ සංවර්ධන හා පුහුනු අංශය,
ප්‍රතිපත්ති අංශය,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේහ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07"

අ.කලේ/(පී.එන්.එම්. ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන. පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.